ISSN: 2012-7235

# [05]
# වහල් සමාජයේ මානව සම්පත් උපයෝජන ක්‍රම

**ආර්. ජී. එස්. ලක්ෂිකා, බී. ඩී. පී. රොද්‍රිගෝ, එල්. එල්. ඩී. එන්. මධුවන්ති,**
**වී. ආර්. රණසිංහ, ඒ. එච්. පී. චාමිකා**

## 1. හැඳින්වීම

ලොව දියුණු ශිෂ්ඨාචාර බිහිවීමත් සමග ඇති වූ වහල් හිමියා හා වහලුන් අතර සබඳතාවය වර්තමාන ලෝකයෙත් විවිධ පැතිකඩයන් ඔස්සේ දකින්නට ලැබෙන අතර මෙම වහල් සේවය ප්‍රථමයෙන්ම දකින්නට ලැබෙන්නේ අප්‍රිකානු මහද්වීපය තුළයි[1]. 17වන සියවස ආරම්භ වන තෙක්ම ඉතා දියුණු ශිෂ්ටාචාරයකට උරුමකම් කියු අප්‍රිකානු මහද්වීපය යූරෝපියන්ගේ යටතට ගැනීමත් සමඟම මෙම වහල් සේවය ආරම්භ වී ඇත[2]. ඒ අනුව වහල් සමාජයේ මානව සම්පත් උපයෝජන ක්‍රම යන තේමාව ඔස්සේ වහල් සේවය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් සිදු කිරිම මෙම ලිපියේ මුලික අරමුණ වේ. වහල් සේවයේ ඉතිහාසය හා ආගමික පසුබිම මෙහි ප්‍රථමයෙන් අවධානය යොමු කර ඇති අතර ඉන් අනතුරුව වහල් සේවයේ ලක්ෂණ හා වහල් සේවයේ විවිධ පැතිකඩයන් පිළිබඳව සාකච්ඡා කරයි. දැඩි තාඩන පීඩන තර්ජන මධ්‍යයේ ස්ව කැමැත්තකින් තොරව තම ස්වාමියාගේ අනසකට යටත්ව සමාජයේ ඉහළ යැයි සම්මත සමාජ පන්තියකට සේවය කළ මෙම වහල් සමාජයේ ශ්‍රමික උපයෝජන ක්‍රමවේද පිළිබඳව අවසාන වශයෙන් අවධානය යොමු කොට ඇත.

## 2. වහල් සේවයේ ආරම්භය

විවිධ ශිෂ්ටාචාරයන් ආරම්භ වීමත් සමඟ වහල් බව මිනිස් සමාජයට පැමිණි බවට සාධක හමු වී ඇත[3,4]. දඩයම්කරුවන්ට හෝ ආදී ගොවීන්ට වහලුන්ගේ අවශ්‍යතාවයක් නොවු අතර ඔවුන් සිය පරිභෝජනයට සෑහෙන ආහාර ප්‍රමාණයක් ඔවුන් විසින්ම රැස් කර ගැනිම සිදු විය[5]. එම නිසා අමතර මිනිසෙකුගේ සේවය ලබා ගැනිමෙන් ඔවුන්ට කිසිඳු ආර්ථික වාසියක් අත් නොවීය.

Gascoigneiy Bamber[6] පවසන පරිදි පසුකාලීනව ජනතාව නගර කරා ඇදී ඒමත් සමඟම ගම්බදව වගා කටයුතු සඳහා වැඩි බිම් ප්‍රමාණයක් ලබා ගැනිමට හැකි වීම තුළින් ආහාර අතිරික්තයක් නිෂ්පාදනය විය. මෙම අතිරික්ත නිෂ්පාදනයන් හේතු කොට ගෙන විවිධාකාරයේ නිෂ්පාදන කර්මාන්තයන් ආරම්භ විය. එවැනි විශාල ගොවිපලවල හෝ වැඩබිම්වල සේවය සඳහා ඉතා අවම මිලකට ශ්‍රමිකයන් සපයා ගැනිමට පසුබිම සකස් වී තිබිණි. මෙය වහල් භාවය ඇතිවීමට ප්‍රධාන පසුබිම් සාධකයක් බවට පත් වූ අතර ශ්‍රමිකයන් සඳහා ගෙවිය යුතු ගාස්තුව එවකට වෙළඳපලේ ආහාර හා නවාතැන් සඳහා ගෙවිය යුතු මිළටත් වඩා පහළ අගයක් ගැනීය[7].

සෑම පුරාණ ශිෂ්ටාචාරයකම වාගේ වහලුන් භාවිතයට ගැනුණු බවට අනාවරණය වී ඇති අතර වහලුන් සපයා ගැනිමද ඉතා පහසු කටයුත්තක්ව පැවති බවට හෙළි වී තිබේ[8]. බොහෝ විට එවකට පැවති යුද්ධයන් සඳහා වහලුන් නිරන්තරයෙන් උපයෝගී කර ගෙන ඇත. ඇතැම් විට සතුරු හමුදාවන් නගරය ආක්‍රමණය කළ විට එහි නගර වාසීන් වහලුන් බවට පත් කර ඉතිරිය මරා දැමු බවට ඉතිහාස වාර්තාවන් හෙළි කරනු ලැබේ[9,10]. මීට අමතරව වහලුන් අත්පත් කර ගැනීමේ ක්‍රම රාශියක් පැවතුණ අතර මුහුදු කොල්ලකරුවන් සිය සිරකරුවන් විකිණීම, දිළින්දන් සිය දරුවන් විකිණීම ආදිය දැක්විය හැක. එපමණක් නොව අපරාධකරුවන්ට දඬුවම් ලෙසද වහල් භාවයට පමුණුවන ලද අතර ණය ගෙවා ගැනීමය

ISSN: 2012-7235

නොහැකි වූ පුද්ගලයන්ටද සිය නිදහස අහිමි කරනු ලැබීය[11]. තවද වහලුන්ගේ දරුවන් නිරායාසයෙන්ම වහලුන් බවට පත් විය[12].

පහත දක්වා ඇත්තේ විවිධ කලාපවලදී යොදා ගත් වහලුන් පිලිබඳ තොරතුරුය.

### 2.1 බැබිලෝනියාවේ වහලුන්

අතීත සමාජයන්හි වහලුන් පිළිබඳ දැක්වෙන තොරතුරුවලට අනුව වහලුන් සිය හිමිකරුවන් සතු වටිනා දේපලක් ලෙස සඳහන් කොට තිබේ. බැබිලෝනියාවේ හබුරාබි සංග්‍රයෙහි වහලුන් වෙත ලබා දුන් පරිදාන හා දණ්ඩනයන් පිළිබඳ සඳහන් වන අතර වාර්තාවලට අනුව වහලුන් නිරන්තර හිංසනයන්ට ලක්කළ අතර කෲර සමාජ පද්ධතියක් පැවති බවට සාධක හමුවී ඇත[13,14].

### 2.2 ග්‍රීසියේ වහලුන්

ග්‍රීසියේ ප්‍රමුඛ පෙළේ නගර දෙකක් වූ ස්පාටා (Sparta) හා ඇතැන්ස් (Athens) සම්පූර්ණයෙන්ම ශ්‍රමය බලෙන් ලබා ගැනීමේ ක්‍රමවේදයන් අනුගමනය කළ නගර දෙකකි[15]. ස්පාටාහි පැවති තත්ත්වය වහල්භාවයකට වඩා දාසත්වය ප්‍රමුඛ කොටගත් සමාජ පද්ධතියක් ලෙස හඳුනාගත හැක[16]. එහි පැවති තත්ත්වය නම් පාරම්පරික ඉඩම්වල පිටිසර ජීවන ක්‍රමයට හුරු වූ ස්පාටා නගර වැසියන් සිය ඉඩම් හිමි ස්පාටීන් වෙත දාසකම් කළයුතු වීමයි[17]. එහිදී ඔවුන් අයිතිවාසිකම් කිහිපයක් පමණක් භුක්ති විඳීමට වරම් ලැබී තිබුණි.

ඇතැන්ස්හි තත්ත්වය මීට වඩා හාත්පසින්ම වෙනස් වූ අතර ඔවුන්ට කිසිදු අයිතිවාසිකමක් භුක්ති විඳීමේ හැකියාවක් නොතිබිණි. වඩාත්ම අවාසනාවන්ත තත්ත්වය උදාවූයේ පතල්වල සේවය කළ වහලුන්ටයි[18]. ඔවුන් ජීවිතාන්තය තෙක් දරුණු වධ හිංසා යටතේ සේවය කළ අතර සෘජුවම ඔවුන් රාජ්‍යයේ දේපළක් ලෙස නම් කරනු ලැබීය[19].

බහුතරයක් වූ ඇතැන්ස් වහලුන් ගෘහ සේවකයන් වශයෙන් කටයුතු කළ අතර ඔවුන්ගේ වරප්‍රසාද පූර්ණ වශයෙන් වහලා හා ස්වාමියාගේ සබඳතාවය මත පදනම් විණි[20]. වහල් සේවිකාවන්ගෙන් බහුතරය දරුවන් රැකබලා ගන්නියන් හෝ උපභාර්යාවන් වශයෙන් සේවය කළ අතර වහල් සේවකයන් ගෘහ සේවයේ නියුක්ත විණි. කිසිඳු නිදහස් ඇතැන්ස් වැසියෙකු තවකෙකුගේ යටතේ සේවකයෙකු නොවූ අතර එසේවීම නිග්‍රහයක් කොට සැලකීය. එය පදනම් කොටගෙන ව්‍යාපාර කළමනාකරණය සඳහා සහය වූ නිදහස් ඇතැන්ස් වැසියන්ට අනු තනතුරු පිරිනමන ලදහ.

### 2.3 රෝමයේ වහලුන්

GascoigneiyBamber[21] දක්වන පරිදිශ්‍රේෂ්ඨ රෝම අධිරාජ්‍යයෙහි වහලුන්ට පවා ස්වයං අභිමානයක් සහිත නිදහස් පුද්ගලයෙකු වීමේ අවස්ථාවන් පුදකරනු ලැබූ අතර වඩාත් වරප්‍රසාද ලැබූ වහලුන් වූයේ අධිරාජ්‍යයාගේ කාර්යය මණ්ඩලයේ වුන් පුද්ගලයන්ය. නමුත් මෙම අවස්ථාවන් ව්‍යතිරේකයන් ලෙස හඳුනාගත හැක. සියවස් 2කට පෙර රෝම අධිරාජ්‍යයේ මුල් යුගයේදී රෝමන්වරු වහලුන් බහුලව භාවිතයට ගත් අතර ඔවුන්ට කෲර වධ හිංසා පමුණුවනු ලැබීය. වහලුන් සේවයේ යොදවමින් අඛණ්ඩව ශ්‍රමය ලබා ගැනීමට නිරන්තර කසපහර දුන් බවට පැහැදිලිව පෙනෙන්නට තිබේ[22,23]. ඊට අමතරව වහලුන් ගැලැඩියේටර්වරුන් ලෙස මහජන අංගයන් තුළ රෝමන්වරුනගේ විනෝදාස්වාදය උදෙසා මාරාන්තික සටහන්වලට යොමුකර ඇත[24].

ISSN: 2012-7235

රෝමයේ සිටි වහලුන් බොහෝ දෙනෙක් යුරෝපය හා මධ්‍යධරණිය පෙදෙස්වලින් රැගෙන ආ අය වු අතර රෝමානු නීතිය යටතේද ඔවුන්ව දේපලක් ලෙස සලකන ලදහ[25].

## 2.4 මධ්‍යකාලීන යුගයේ වහලුන්

බටහිර රෝම අධිරාජ්‍යය බිඳ වැටුණු සමයෙහි, මධ්‍යධරණී ප්‍රදේශවල නැවත් වහල් සමාජ ක්‍රමය ආරම්භ විය[26]. නමුත් වහලුන් ගෘහ සේවයට හා යුධකටයුතු සඳහා පමණක් සීමා කරන ලදි. එහෙත් ඇමරිකානු යටත්විජිත භාවය ආරම්භ වීමත් සමගම ව්‍යාප්ත වූ කපු හා දුම්කොළ වගාවන්වලට වහලුන් භාවිතා කළ කාලසීමාව දක්වා රෝමයේ පැවති කණ්ඩායම් වහල් ක්‍රමයේ ලක්ෂණ දක ගැනීමට නොලැබුණි. මධ්‍යධරණී මුහුද ආශ්‍රිතව පැවති ස්වභාවික පිහිටීම වහල් වෙළඳාම කරගෙන යාමට ප්‍රබල හේතුවක් විය. පහත දැක්වේන පරිදි එහි පැවති ආර්ථික පරිසරය හා භූගෝල පරිසරය වහල් සමාජ ක්‍රමය දිරි ගැන්වීමට පසුබිමක් සපයා ඇති බව පෙනි යයි.

- *මධ්‍යධරණී මුහුදට වටවූ ශිෂ්ට වූ කලාපයන්*
- *උතුරෙන් හා දකුණු ප්‍රදේශවල ශිෂ්ට නොවූ ශ්‍රෝතයන් බහුලව පැතිර තිබීම.*
- *දේශසීමා පිළිබඳ පැවති සටහන් අවසන් වූයේ ගෝත්‍රිකයන් වහල් භාවයට බඳවා ගැනීම.*
- *වහල් වෙළඳාම දියුණුකර ගැනීමේ අරමුණ ඇතිව වෙළඳපොළ බලවේගයන් ගෝත්‍රිකයන් සිරකරුවන් වශයෙන් ග්‍රහණයට ගැනීම*[27].

10 වන සියවසෙහි ජර්මානුවන් පෙරදිග පැතිරීමත් සමගම බොහෝ වහලුන් ඔවුන්ගේ වාර්ගික නාමයෙන් අල්ලා ගනු ලැබූ අතර, එම වාර්ගිකනාමය පොදුවේ ඔවුන්ව වහලුන් ලෙස හඳුනා ගැනීමට යොමු කරන්නක් විය.

රුසියාව විසින් එම කාලයේදී කළු මුහුදු කලාපයට වහලුන් රැගෙනයාමද වැදගත් අවස්ථාවක් විය. මධ්‍යධරණියෙහි දකුණු ප්‍රදේශයේ අරාබි රාජවාංශිකයන් සතු වූ වෙරළ තීරය අප්‍රිකානු වහල් වෙළඳාම උනන්දු කරවීමට සමත් විය. සහරාවෙහි වූ සවිලා (Zawilla) නගරය වහල් වෙළඳමේ පැවති ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස එකල හඳුනාගෙන ඇත. චැඩ් ඇල (Lake Chad) කලාපයෙන් අල්ලාගන්නා ලද වහලුන් අරාබි නිවෙස්වල වහල් සේවය සඳහා විකුණනු ලැබූ අතර අප්‍රිකානුවන් සහරා කාන්තාරය, රතු මුහුද, ඉන්දියන් සාගරය හා උතුරු අප්‍රිකාව හරහා ලෝකය පුරා ව්‍යාප්ත විය[28].

## 2.5. පෘතුග්‍රීසි වහල් වෙළදාම

15 වන සියවසේ පෘතුග්‍රීසින්ගේ ආගමනයත් සමඟ යුරෝපියන් උප සහරානු අප්‍රිකාව සමඟ සබඳතා පැවත්වීය[29]. මෙම කලාපය මැද පෙරදිගට සහරාව හරහා වහලුන් සැපයීමේ ප්‍රධාන මුලාශ්‍රයක් බවට ද පත් විය.

ගිනිකඳුවලින් හටගත් තුඩුවක් සහිත වු ද කඳු හා බිය උපදවන සමුද්‍ර තිරයක් සහිත මනුෂ්‍ය වාසයක් නොමැති වර්ඩ් දිවයින වහල් වෙළදාම සඳහා ස්වභාව ධර්මයෙන් ම තනා දුන් දිවයිනක් ලෙස ද එකල හැඳින්විය. එසේ වුවත් ඔවුන් සර්ම කලාපීය සාරවත් මිටියාවත් ද ඔවුන්ගේ අණසකට නතු කරනු ලැබු අතර බටහිර අප්‍රිකාව, යුරෝපය හා ඇමරිකාව අතර මුහුදු මාර්ගයන්ට ඔවුන් හොදින් ස්ථානගත විය. වර්ෂ 1460 පමණ වන විට පෘතුග්‍රීසි පදිංචිකරුවන් වර්ඩ් දිවයිනේ සිට ඔවුන්ගේ පදිංචිය වෙනස් කරනු ලැබු අතර ඔවුන් ගයනාවේ වෙරලබඩ තිරයේ ස්ථානයක් ආරම්භ කරන ලදහ. අප්‍රිකානු සිරකරුවන් මිල දී ගැනිම සදහා මෙලෙස මිලදී ගනු ලබන ඇතැම් වහලුන් වර්ඩ් දූපතේ පදිංචිකරුවන්ගේ

ISSN: 2012-7235

වතුවල වැඩ කිරිමට යොදාගැනුණු අතර අනෙක් වහලුන් වෙළඳාම් කිරිම සඳහා උතුරට යවා ඇත[30].

පසු කලෙක වර්ඩ් දූපත වහල් වෙරළ ලෙස ද හඳුනා ගැනුණි. වහලුන් වර්ඩ් දූපත්හි සරුසාරට මිටියාවත්වල කපු හා ඉන්ඩිගෝ වගාවන් හි යෙදුනෝය. ගිහිගි ඇඳුම් සඳහා ද නිතිපතා වර්ඩ් දිවයිනට ගමන් කිරිමට අවශ්‍ය නැව් ගාස්තු සඳහා ද වහලුන් විකුණනු ලැබීය. මෙම අප්‍රිකානු හා වර්ඩ් දූපත්හි වෙළඳාමේ සාර්ථකත්වය පදනම් කරගෙන කැරබියන් හා ඇමරිකාව පුරා ශ්‍රම මුලික සිනි, කපු හා දුම්කොළ වගාවන් ව්‍යාප්ත විය.

වර්ෂ 1440 සිට පෘතුග්‍රිසින් අප්‍රිකානු වහලුන් ඇට්ලාන්ටික් හරහා ලිස්බන් වෙත ගෙන්වා ඇති අතර 15 හා 16 වන සියවස් වන විට අයිබිරියාවේ උතුරු අප්‍රිකානු වහලුන් හා මුස්ලිම් වහලුන් ගණන කළු අප්‍රිකානු වහලුන් ගණනට වඩා ඉක්ම වු නමුත් 17 වන සියවස වන විට කළු අප්‍රිකානු වහලුන් ලිස්බන් ජනග්‍රහණයෙන් 15% පමණ විය[31].

එකල පෘතුග්‍රිසින් සතු වු ඔවුන්ගේ ප්‍රවාහන ඒකාධිකාරය උපයෝගි කරගෙන වහලුන් ඔවුන්ගේම යටත් විජිතයක් වූ බ්‍රසිලයට ගෙන යෑමට කටයුතු කර ඇත. 18 වන සියවස වන විට බහුතරයක් වූ මෙම වහල් ව්‍යාපාරය බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් කරගෙන යනු ලැබීය. ඔවුන් විසින් මෙය ත්‍රිකෝණාකාර වෙළඳාමක් ලෙස නම් කර ඇත.

**2.5 වහල් සේවය සඳහා ආගමික පසුබිම**

වහල්භාවය හත් වන සියවසේදී මුස්ලිම් ජීවන රටාවේ කොටසක් ලෙස පිළිගැනුණු අතර කුරාණයෙහිද ඊට ප්‍රතිවිරුද්ධව කිසිදු අදහසක් ප්‍රකාශකර නොමැත.  එහි හුදෙක් සඳහන් වන්නේ කාන්තා වහලියන් සඳහා හොඳින් සැලකිය යුතු බව පමණි. ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මය තුළද වහල්භාවය පිළිබඳ කිසිඳු සඳහනක් නොමැත[32].

ආදි මධ්‍යම යුගයෙහි රෝමානු කතෝලික පල්ලිවල සිටින මිෂනාරීවරුත් හා බිෂොප්වරු උතුරු යුරෝපයෙහි ඇති වෙමින් පැවති වහල් හිමිකරු භාවයට විරුද්ධ විය.  ක්‍රමයෙන් වහල්භාවය බටහිර යුරෝපිය රටවලින් තුරන් වී ගිය අතර ඒ වෙනුවට වැඩවසම් දාස ක්‍රමයක් බිහිවිය.

නමුත් 15 වන සියවසෙහි බටහිර අප්‍රිකානු රටවලට පෘතුග්‍රීසීන්ගේ ආගමනයත් සමඟ නව හා විනාශකාරී යුගය නැවතත් ආරම්භ විය.ඒ කාලය අතරතුර පුරුද්දක් ලෙස මුස්ලිම්වරුන් යුද්ධය සඳහා වහලුන් භාවිතය මධ්‍යම පෙරදිග රටවල වහල්භාවය පැතිරීමට හේතුවිය[33].

**3. වහල් සේවයේ ලක්ෂණ**

සාමාන්‍ය සේවකයෙක් හා වහලෙක් අතර සමානකම් මෙන්ම අසමානකම් ද දැකිය හැක. අතීත හා නූතන සමාජය දෙස බැලීමේදී සාමාන්‍ය සේවකයෙක් යනු කිසියම් ගිවිසගත් කාලපරිච්ඡේදයක් තුළ ණයක් පියවීම හෝ මුදල් හෝ දේපල ඉපයීම සඳහා සේවය සපයන්නායි.  එහෙත් යම් පුද්ගලයෙක් තම හිමිකරුට අයත් දේපළක් සේ තබා ගනි නම් හෙතෙම 'වහලෙක්' ලෙස සලකයි[34].  වහල් සේවකයාගෙන් බලෙන් වැඩ කරවා ගන්නා අතර වැටුපක් නොගෙවයි. සාමාන්‍ය සේවකයා හා වහලා යන දෙපාර්ශවයම සමාජයේ පහළ පන්තිය නියෝජනය කරන අතර ඉහළ පන්තිය වෙත සේවය කරයි.

ISSN: 2012-7235

එහෙත් සාමාන්‍ය සේවකයා ස්ව කැමැත්තෙන්ම සේවයේ නිරත වන අතර ගිවිසගත් කාලයක් සඳහා සේවය කරයි. එනමුදු වහලෙකු වශයෙන් සේවය කරන පුද්ගලයා සිය කැමැත්තකින් තොරව ජීවිත කාලය පුරාවටම සේවය කරයි.
අතීතයේදී වහලා යනු සිය ස්වාමියාට අයත් දේපළක් වූ අතර එම පුද්ගලයාට ඉතා අමානුෂික ආකාරයෙන් සැලකූ බවක් පෙනී යයි[35,36]. සැබැවින්ම සිය අභිමතාර්ථයන්ට එරෙහිව වැටුපක් රහිතව තර්ජනයන් මධ්‍යයේ කටයුතු කිරීමට වහලුන්ට සිදුවිය. වහලුන් සඳහා කිසිදු අධ්‍යාපනික හෝ දේශපාලනික අයිතිවාසිකම් නොලැබුණු අතර දැඩි තාඩන පීඩනයන් මධ්‍යයේ ඔවුන්ගේ ශ්‍රමය සූරා කැමකට ලක් වෙන ලදී[37].

තවද *"වහල් හිමියාට තම සේවකයින් හඳුනාගත නොහැකි අවස්ථාවලදී ඔවුන්ව හංවඩු ගැසූ බවටත්, හිස මුඩු කල බවටත් ඉරී වැටුණු ඇඳුම් අඳින්නට සැලැස්සූ බවටත් අනාවරණය වේ"*[38].

### 4. වහල් සේවයේ පැතිකඩයන්

19 වන සියවසේ වහල් සේවය අහිමිටවුවද එය සම්පූර්ණයෙන් නැති වූ බවක් වර්තමාන සමාජය දෙස බැලීමේදී අපට පෙනෙන්නට නැත. ලාබාල දරුවන් සේවයේ යෙදවීම, කාන්තාවන්ව ගණිකා සේවයේ යෙදවීම, ලාබාල ගැහැණු දරුවන්ව වයස්ගත පිරිමින්ට විවාහකර දීම අදටත් සමාජයේ දකින්නට ලැබෙන කාරණාවන් වේ. පුරාණ කාලයේ මෙන් වහලුන් අල්ලා ගෙන වහල් නැව්වල නංවා, ප්‍රසිද්ධියේ ඔවුන් වෙන්දේසි නොකළද මිලියන ගනණක් වූ ගැහැනුණ්, පිරිමින් හා ළමයින් නීතිවිරෝධී ලෙස මිනිස් ජාවාරමේ යොදවනු ලබයි.

ජාත්‍යන්තර ශ්‍රමික සංවිධානය පවසන ආකාරයට අදටත් මිලියන 21 පමණ ජනතාව වහල් සේවයේ යෙදෙන බවට අනාවරණය වී ඇත. Anti-Slavery International ආයතනයට අනුව වහල් සේවයේ පැතිකඩ කිහිපයකි[39-41].

- ඇපයට බැඳුණු ශ්‍රමිකයන් (Bonded Labour)
- ළමා වහල් සේවය (Child Slavery)
- බාල වයස්කාර විවාහයන් (Child and Forced Marriages)
- පාරම්පරික වහල් සේවය (Descent Based Slavery)
- හොර ජාවාරම් සඳහා මිනිසුන් වහලුන් ලෙස යොදාගැනීම (Human Trafficking)

### 4.1. බාල වයස්කාර විවාහයන්

යුනිසෙෆ් සංවිධානයට අනුව 2012 වර්ෂය වන විට 11% ලෝකය පුරා කාන්තාවන් වයස අවුරුදු 15 ට පෙර තම විවාහය සිදුකර ඇති බවට අනාවරණය වේ[42]. බාලවයස්කාර විවාහයන් පිරිමි ළමුන් යොදාගෙන විවාහයන් කෙරෙන අවස්ථාද දකින්නට ලැබෙන අතර බහුතරයක් බාල වයස්කාර ගැහැණු ළමුන් යොදාගෙන සිදුකෙරෙන විවාහයන් වේ.

මෙම විවාහයන් හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අසාර්ථක වන අතර ඔවුනගේ කායික හා මානසික සෞඛ්‍යයද පිරිහෙයි.

කෙසේ නමුත් වයස අවුරුදු 16-18 අතර කෙරෙන විවාහයන් වහල් සේවයේ පැතිකඩයක් ලෙස නොසැලකෙන අතර යම්කිසි බාල වයස්කාර විවාහයක් වහල් සේවයක් ලෙස සැලකීමට නම් එහි පහත අංගයන් තිබිය යුතු වේ[43].

ISSN: 2012-7235

- විවාහය සිදුකරන දරුවා තමාගේ විවාහය කිරීමට කැමැත්ත නියම වශයෙන් ලබාදී නොමැතිවීම.
- දරුවාට එම විවාහය අවසන් කිරීමට නොහැකි නම් හෝ මුළු ජීවිත කාලයටම තම ස්වාමියාට වහලෙකු ලෙස සේවය කිරීමට බැඳී සිටීම.
- බලහත්කාරකම් මගින් හෝ තර්ජනයන්ගෙන් අයිතිකර ගැනීම හෝ සාමාන්‍ය ගෙදර දොර වැඩ කරගැනීමට හෝ ඒකමතික නොවන ලිංගික සම්බන්ධතා පැවැත්වීමට විවාහකර ගැනීම.

බාලවයස්කාර දරුවෙකුට වැඩිහිටියන් මෙන් විවාහ ජීවිතය පිළිබඳ තීරණගත නොහැකි අතරප්‍රචණ්ඩකාරී හැසිරීම්, තර්ජනයන් මගින් මෙම දරුවන් පාලනය කළ බවද පෙනී යයි.

### 4.2. ඇපයට බැඳුණු ශ්‍රමිකයන්

මෙය වහල් සේවයේ එක්තරා පැතිකඩක් ලෙස හැඳින්විය හැක. යම්කිසි පුද්ගලයෙක් ණයක් ලබාගත් විට එය ආපසු පියවීමක් ලෙස ණය ලබාදුන් පුද්ගලයාට සේවය කරන්නෙකු ඇපයට බැඳුණු ශ්‍රමිකයෙකු ලෙස හැඳින්වේ[44,45]. සාමාන්‍යයෙන් ඇපයට බැඳුණු ශ්‍රමිකයන් වැටුප් රහිතව තම සේවය සපයන අතර සුළු පිරිසකට අවම වැටුපක් ගෙවන ලදී. මෙම ණය පියවීම පරම්පරාවෙන් පරම්පරාවට උරුම වන අතර ඔවුන්ට තමන්ට ණය ලබාදුන් පුද්ගලයාට මිස තව අයෙකු යටතේ සේවය කළ නොහැක. ජාත්‍යන්තර ශ්‍රමික සංවිධානය (ILO) ට අනුව *ආසියානු පැසිෆික් කලාපයේ පමණක් මිලියන 11.7 පමණ බලහත්කාරයෙන් තබාගන්නා සේවකයන් සිටින අතර ඉන් බහුතරයක් මෙම ඇපයට බැඳුණු ශ්‍රමිකයන් වේ*[46]. දරිද්‍රතාවය අඛණ්ඩව පැවතීම හා එදිනෙදා ජීවිතය පවත්වාගැනීමට මුදල් අවශ්‍යවීම නිසා මෙම ශ්‍රමිකයන් තම සේවය සැපයීමට යොමුවී ඇති බවක් පෙනී යයි.

### 4.3. ළමා වහල් සේවය

ජාත්‍යන්තර සේවක සංවිධානය පවසන ආකාරයට මිලියන 8.4 පමණ මුළු ලොවපුරා වහලුන් ලෙස ළමුන් යොදා ගන්නා අතර තවකෙකුගේ ලාභ ඉපයීමක් සඳහා ඉතා උපද්‍රව සහිත කටයුතුවල යොදවන ළමුන් ළමා වහලුන් ලෙස හැඳින්විය හැක[47]. මධ්‍යම හා බටහිර අප්‍රිකානු රටවල අනාරක්ෂිත තත්වයන් යටතේ මිනිසුන් ඉතා අඩු වැටුපකට හෝ වැටුප් රහිතව කොකෝවා වගාවන්වල මෙන්ම රත්රන්, දියමන්ති පතල්වල සේවයේ යෙදෙන අතර ඉන් බහුතරයක් ළමා මෙහෙකරුවන් වීම කැපී පෙනෙන ලක්‍ෂණයකි.

බොහෝ විට ගණිකා සේවයේ යෙදවීම, නීති විරෝධී කටයුතු සඳහා යෙදවීම, හිඟමන් යැදීමට යෙදවීම, මත්ද්‍රව්‍ය ව්‍යාපාරවල යෙදවීම මේ සඳහා උදාහරණ වේ[48,49].

### 4.4. පරම්පරාවෙන් උරුමවන වහල් සේවය

මෙහිදී යම්කිසි අයෙකුගේ මව කාන්තා වහලියක් නම් එම පුද්ගලයාද තම ජීවිත කාලය පුරාවටම වහලෙක් බවට පත්වේ[50,51]. ඔවුනට වැටුපක් රහිතව තම ස්වාමියාට ජීවිත කාලය පුරාවට සේවය කිරීමට සිදුවේ. බොහෝ විට ස්වාමියන් මෙම වහලුන්ට සලකන ලද්දේ තමන්ට අයත් දේපලක් වශයෙනි[52]. වහලුන්ව විකිණීම හෝ ත්‍යාගයක් ලෙස අන් අයට ලබාදීම වහල් හිමිකරුවාගේ අභිමතය මත සිදුවුණි[53,54].

මෙම වහලුන් සඳහා අධ්‍යාපනික හෝ දේශපාලනික අයිතිවාසිකම් නොලැබුණු අතර තමන් කැමති සහකාරියෙක් හෝ සහකාරයෙක් සමඟ විවාහ වීමටවත් අයිතියක් ඔවුන්ට නොලැබුණි. බොහෝ අවස්ථාවන්හිදී වහල් සේවයේ නියුතු ගැහැණු දරුවන්ට තම

ISSN: 2012-7235

ස්වාමියාගෙන් අතරවර සිදුවූ අතර කුඩාකාලයේම ඔවුන්ව ලිංගික වහල් සේවයේ හා ගෘහාශ්‍රිත වහල් සේවය සඳහා විකුණණු ලැබීය[55].

මෙම වර්ගයේ වහලුන් බොහෝ විට දකින්නට ලැබෙන්නේ විවිධ පන්තිවලට බෙදීගිය සමාජයක් තුළවන අතර සමාජයේ ඉතා පහළ කුලයකට මොවුන් අයිති වේ. කෙසේ වෙතත් වහල් විවාහයන් සඳහා නීතිමය පදනමක් නොතිබුන නමුත් වහල් හිමියන් විසින් වහලුන් අතර වන විවාහයන් සිදු විමට දිරි ගන්වන ලදහ[56,57]. වහල් සේවය පරම්පරාවේන් පරම්පරාවට උරුම වීමට මෙය රුකුලක් වන අතර වහල් ශ්‍රමිකයා කෙසේ හෝ වහල් හිමියා තුළ රඳවා තබා ගැනිමටද මෙම විවාහයන් හේතු වේ.

**4.5. නීති විරෝධී කටයුතු සඳහා මිනිසුන් වහලුන් ලෙස යොදවා ගැනීම**

පාරම්පරික දරිද්‍රතාවයෙන් මිදීම, විවිධ විෂමාචාරවලින් මිදීම අරමුණු කරගෙන හා තමාගේ හා සිය පවුලේ ජීවන තත්ත්වයන් උසස්කර ගැනීම උදෙසා බොහෝ විට මිනිසුන් මෙම නීතිවිරෝධී කටයුතුවල අකමැත්තෙන් වුවද යෙදෙනු ලැබීය[58].

බොහෝවිට මෙම පුද්ගලයන්ව බලහත්කාරයෙන් සිය කැමැත්ත නොමැතිව ගණිකා සේවයේ යෙදවීම, හිඟමන් යැදීමට යෙදවීම, අපරාධ කිරීමට යෙදවීම, සිරුරේ අවයව ඉවත් කිරීම සිදුවේ.

**5. වහල් ශ්‍රමික උපයෝජන ක්‍රමවේදය**

කෝට්ටවත්ත[59] ට අනුව මානව සම්පත් කළමණාකරණයේ පවත්නා සියලුම ශ්‍රිතයන්හි අවසන් අරමුණ වනුයේ සේවකයා සංවිධානය තුළ රඳවා තබා ගැනීමයි. ඒ අනුව බලනකල මානව සම්පත් කළමණාකරණය සංවෘත පද්තියක් ලෙස හැඳින්විය හැක. මන්දයත් සංවෘත පද්ධතියක දී ද සලකා බලනුයේ සලකා බලනු ලබන පද්ධතිය අනෙකුත් බාහිර පද්ධතින් සමඟ ගණුදෙනු නොකිරිමයි. එලෙස සංවිධානයක මානව සම්පත් කළමනාකරණය සංවෘත වී පවත්නා විට සේවකයන් සංවිධානය තුළ රැඳෙනු ඇත. එවිට සේවක ගැටලු අවම වන අතර සේවකයා සංවර්ධනය කිරිම සිදු කළ හැක. ඉහත සියල්ල සලකා බලනකල මානව සම්පත් කළමනාකරණය සංවෘත පද්ධතියකට නැකම් කියන අතර එහි අවසන් ඵලය වනුයේ සේවක රඳවා ගැනිමයි.

මෙහිදි විවෘත පද්ධතියක් කුමක් ද? යන්න පිළිබඳව දළ අදහසක් ලබා ගැනීම පසුව විස්තරකිරිම්වලට රුකුලක් වනු ඇත. විවෘත පද්ධතියක දි බාහිරව පවත්නා උප පද්ධතින් සලකා බලනු ලබන ප්‍රධාන පද්ධතිය සමඟ ගනුදෙනු කරනු ලැබේ. එවිට සේවකයාට දැනුම ලබා ගැනිමට ඇති මාර්ගයන් විවෘත වන අතර එවැනි අවස්ථාවන්හිදි සංවිධානයක සේවකයන් රඳවා ගැනිම දුෂ්කර වේ.

මෙම ලිපියෙහි සඳහන් කළ වහල් සමාජයේ පැතිකඩ හා වහල් සමාජයේ පැවති ලක්ෂණ නැවතත් පිරික්සිමේ දී එකල වහල් සමාජය තුළ ද පැවතියේ සංවෘත පද්ධතියක්යැයි පැවසිය හැක. මන්ද වහල් හිමිකරු ගත් සෑම ප්‍රයත්නයකට ගැබ්ව තිබුණේ දැඩි නිතිරිති පද්ධතියක් පනවමින්, අධ්‍යාපනයට ඇති දොරටු අවහිර කරමින් වහල් සේවකයා ඔහු තුළ රඳවා තබා ගැනිමයි[60].

නුතන සමාජයේ පමණක් නොව මිනිසාගේ විකාශනයත් සමඟ ආරම්භ වු විවිධ යුගයන්හි දි ඒ ඒ යුගයන්ට අදාළව සිදු කෙරුණු මානව සම්පත් උපයෝජන ක්‍රම දැකිය හැක. ඒ අනුව වහල් සමාජ ක්‍රමයෙහි ද ශ්‍රමික උපයෝජන ක්‍රමයන් දැකිය හැක. මෙහිදි එම ක්‍රමවේදයන්හි

ISSN: 2012-7235

සාර්ථක අසාර්ථක භාවය පිළිබඳව තක්සේරු කිරීම මුලිකවම අරමුණු කර නොගන්නා අතර භාවිතා වූ ශ්‍රමික උපයෝජන ක්‍රම පිළිබඳව සාකච්ඡා කරයි.

එකල වහල් සමාජය තුළ මානව සම්පත් උපයෝජනය යනු කුමක්ද යන්න පවා ඔවුන් නොදැන සිටි අතර ඔවුන් හුදෙක්ම සිදුකළේ කෙසේ හෝ තම සේවකයන් උපයෝගි කරගෙන වහල් හිමියාගේ අභිමතාර්ථ සාධනය කර ගැනිමකි. කෙසේ නමුත් හොඳින් නිරික්ෂණය කළ විට ඔවුන් දැන හෝ නොදැන මානව සම්පත් කළමනාකරණය සිදු කර ඇති බව වැටහෙනු ඇත.

නූතන සමාජයට අනුව ඉතා සරලව මානව සම්පත් කළමණාකරණය නිර්වචනය කර ඇති අතර *මානව සම්පත් කළමනාකරණය යනු සංවිධානයක අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනිම සඳහා ආයතනය සතු මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායිව උපයොජනය කිරිමයි*[61]. මෙම නිර්වචනයට අනුව බලනකල වහල් හිමියා සිදු කර ඇත්තේ ද ඔහුගේ අභිමථාර්ථ මුදුන් පමුණුවා ගැනිම සඳහා වහල් සේවකයන් වඩා කාර්යක්ෂමව හා ඵලදායිව උපයෝජනය කිරිමයි. මේ අනුව වහල් සමාජය තුළ ද මානව සම්පත් කළමනාකරණය ක්‍රියාත්මක ව පැවතුන බව අනුමාන කළ හැක. නමුත් එය ක්‍රියාත්මක වූ ආකාරය නූතන සමාජයට වඩා වෙනස්ය. එනම් අවසන් අරමුණ එකක් වුව ද වහල් සමාජය හා නූතන සමාජය තුළ එයට ළඟා වීම සඳහා යොදාගන්නා ක්‍රමවේදයන්හි වෙනසක් පවති.

වහල් සේවයේ දී වහල් ශ්‍රමිකයා හුදෙක්ම වහල් හිමියාගේ උපදෙස් ක්‍රියාවට නංවන්නෙකු පමණි. ඔහු අයිතිවාසිකම් රහිත පුද්ගලයෙකු බවට පත් වී තිබුණි. වහල් හිමියා ඔහුට අවශ්‍ය අභිමථාර්ථ සාධනය කර ගැනීම සඳහා වහල් ශ්‍රමිකයාව ඉතා දැඩි නිතිරිති පද්ධතියකට කොටු කර තිබූ බව දක්නට ලැබේ.

මුලින් සඳහන් කළ පරිදි වහල් සමාජය තුළ ක්‍රියාත්මක වුයේ සංවෘත පද්ධතියකි. එහි අරමුණ වනුයේ වහල් ශ්‍රමිකයා කෙසේ හෝ වහල් හිමියා තුළ රඳවා තබා ගැනිමයි. එනම් සේවකයන් සංවිධානය තුළ රඳවා තබා ගැනිමයි. මෙම අරමුණු උදෙසා වහල් හිමියන් ක්‍රියාවට නැංවූ ක්‍රමවේදයන් අනුමත කළ නොහැකි වුවත් එකල එය වහල් සේවකයා රඳවා තබා ගැනිම සඳහා රැකුලක් විය. වහල් හිමියා විසින් වහල් ශ්‍රමිකයාට ලබාදුන් දඬුවම් හා වදහිංසා හේතුවෙන් ඔවුන් වහල් හිමියා හැරදමා යයි යන අනියත බිය වහල් හිමියා සතු විය. එම නිසා වහල් ශ්‍රමිකයන්ට එක්රැස්විමට හා අධ්‍යාපනයට ඇති අවස්ථා අවහිර කිරිම සිදුවිය[62-64]. ආගමික වතාවත් සඳහා හෝ වහල් ශ්‍රමිකයන්ට එක්රැස් වීම සුදු ජාතිකයෙකුගේ සහභාගිත්වයක් නොමැතිව සිදු කිරිම තහනම් කර තිබුණි. එයට හේතුව වනුයේ එසේ එක්රැස් වීමක දී ඔවුන් අතර සන්නිවේදනයක් සිදු වී වහල් හිමියාට එරෙහිව කැරැල්ලක් හෝ විරෝධයක් ඇතිවිම වැළැක්විම සඳහා වේ. එමෙන්ම වහල් ශ්‍රමිකයාට අධ්‍යාපනය, තොරතුරු ලබා ගැනිමට ඇති අවස්ථා අහිමි කෙරෙනුයේ ඔවුන් දැනුමින් හා තොරතුරුවලින් සන්නද්ධ වූ විට වහල් හිමියා හැරදමා යයි යන අදහස ඇතිවය[65,66].

ඉහත කරුණු දෙස බලනකල වහල් සේවකයන්ට ඔවුන්ගේ අදහස් කියා පෑමට හෝ එම අදහස් හුවමාරු කර ගැනිමට අවස්ථාවක් නොතිබූ බව පෙනි යයි. එතුළින් අදහස් වන්නේ වෘත්තිය සමිති යන සංකල්පය සඳහා එකල වහල් හිමියා ද ඉඩ ලබා නුදුන් බවයි. ඔවුන් එක් රැස් වීමෙන් සංවිධානය හැර දමා යයි හෝ සාමුහික ඉල්ලිම් ඉදිරිපත් කරනු ලබයි යන සැකය වහල් හිමියා තුළ ද පැවතිණි. එම නිසා ඔහු වහල් සේවකයන් සාමුහිකව එක්රැස් විම තහනම් කළේය. එය නූතන සමාජය හා ගලපා බලන කල එයින් පෙනී යන්නේ එකල සංවිධාන වහල් ශ්‍රමිකයන්ගේ වෘත්තිය සමිති ඇති කර ගැනිම අවහිර කර තිබූ බවකි. මෙම

ISSN: 2012-7235

සෑම ප්‍රයත්නයකින්ම ඔවුන් අරමුණු කරගෙන සිටියේ සේවක රඳවා ගැනිමයි. එය කොතෙක් දුරට සාර්ථක හෝ අසාර්ථක ද යන්න මෙහිදී සාකච්ඡාවට බඳුන් නොකරයි.

වහල් සමාජයේ ඉතිහාසයට අනුව වහල් සේවකයන්ට අවශ්‍ය වෛද්‍ය සේවාවන් බොහෝවිට තවත් වහල් සේවකයෙකු විසින් හෝ වහල් අයිතිකරුගේ පවුලේ සාමාජිකයන් විසින් සපයන ලද බව වාර්තා වේ[67,68]. සමහර වහල් ශ්‍රමිකයන් සතුව වෛද්‍ය නිපුණත්වයක් පැවතුන බව ද සඳහන් වේ[69]. මෙම කරුණුවලින් පිළිබිඹු වන්නේ වහල් හිමියා යම්තාක් දුරකට වහල් සේවකයාගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වී ඇති බවයි. නමුත් ඔහු මේ පිළිබඳව සැලකිල්ලට ගනු ලැබුවේ ඔහුගේ අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා වහල් ශ්‍රමිකයා වඩා කාර්යක්ෂමව යොදා ගැනිමේ අරමුණ ඇතිව බව මැනවින් අවබෝධ වේ.

ඕනෑම සංවිධානයක මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායිව උපයෝජනය කිරිමට නම් නිති පද්ධතියක් පැවතිය යුතුය. නැතිනම් සේවකයන් ඔවුන්ගේ අභිමතය පරිදි කටයුතුවල නියැලෙනු ඇත. වහල් සමාජය තුළ ද නිති රිති පද්ධතියක් පැවති අතර එය ඉතා කෲර හා ඇතැම් විට ආත්ම ගෞරවය කෙලෙසන ස්වරූපයක් ගත් බව කිව හැක..

වර්ෂ 1850 දී ප්‍රකාශයට පත් වූ ප්‍රකාශනයකට අනුව ප්‍රශස්ත වහල් සේවකයෙකු නිර්මාණය කරන්නේ කෙසේද යන්න පහත පරිදි සඳහන් කර තිබුණි[70].

- ඉතා දැඩි විනය නිති පවත්වාගෙන යාම.
- පුද්ගලයන් පහත් කොට සැලකිමේ අවබෝධය නිර්මාණය කිරිම (එනම් වහල් සේවකයන් ඔවුන්ට හිමි ස්ථානය කුමක්ද යන්න දැන සිටිම).
- තම ප්‍රධානියාගේ ව්‍යාපාරයට ලබැදියාවක් නිර්මාණය කිරීමට පෙළඹවීම.
- අධ්‍යාපනය ලැබිම ඉවත් කිරිම.

ඉහත කරුණුවලට අනුව ප්‍රශස්ත වහල් සේවකයෙකු නිර්මාණය කිරිමට නම් ඉතා දැඩි විනය නිති ක්‍රියාත්මක කළ යුතු බව පෙන්වා දී තිබේ. එනම් එකල වහල් සමාජය තුළ ද නිතිරිති පද්ධතියක් තිබූ බව පැහැදිලි කරයි. එමෙන්ම නූතන සංවිධාන තුළ වැඩි වශයෙන් කතා බහට ලක්වන සංවිධානයට ඇති පක්ෂපාතිත්වය/ ලැදිකම ඉහත කරුණු තුළ ද ඇතුළත්ව ඇත. සංවිධානයක සේවකයා තුළ සංවිධානය කෙරෙහි ඇති කරන්නා වූ ලැදිකම සේවක රඳවා ගැනිමට ඉවහල් වන බව වහල් හිමියා දැන සිටි බව මින් මනාව පැහැදිලි වේ.

වර්ෂ 1820 ට පසුව අන්තර්ජාතිකව වහල් වෙළඳාම තහනම් කළ නිසා ඇතැම් වහල් හිමියන් ඉහත කොන්දේසින් තවදුරටත් වැඩි දියුණු කරන ලද අතර එහි අරමුණු වුයේ වහල් ශ්‍රමිකයන් ඉවත්ව යාම වැළැක්විමය[71].

සංවිධානයක් තුළ සේවක හැසිරිම ඉතා වැදගත් කාර්යක් සිදුකරයි. ඕනෑම සංවිධානයක් තුළ සේවකයන්ගේ හැසිරිම සංවිධාන අරමුණුවලට අනුව ගලපනු ලැබේ. එය හැසිරීම් සංශෝධනය (Behaviour Modification) ලෙස හඳුන්වනු ලැබේ[72]. ඒ සඳහා සංවිධාන දඬුවම් පැමිණවිම (Punishment) වෙරගැන්වුම (Reinforcement) නිරෝධය (Extinction) යනාදි ක්‍රම භාවිතා කරයි. වහල් සමාජය දෙස බැලීමේදී පෙනි යන්නේ හැසිරීම් වෙනස් කිරිම සඳහා දඬුවම් පැමිණවිම යන ක්‍රමය බහුලව භාවිතා කළ බවකි[73].

වහල් ශ්‍රමිකයන්ට අයත්ව සිටි ඇතැම් රාජ්‍යයන් සතුව වහල් ශ්‍රමිකයන් පාලනය කිරිම හා ඔවුන්ට දඬුවම් පැමිණවිම සඳහා නිති පද්ධතියක් පැවති අතර එය වහල් නිති සංග්‍රහය (Slave Code) ලෙස හඳුන්වනු ලබයි[74,75]. එහි පහත සඳහන් දෑ අන්තර්ගතව තිබුණි[76,77].

ISSN: 2012-7235

- සුදු ජාතිකයෙකුගේ අවසරයකින් තොරව කිසිදු දේපලක් රැගෙනයාම තහනම් විය. එසේ ගෙන ගියහොත් සුදු ජාතිකයන්ට ඔවුන්ට දඬුවම් පැමිණවීමේ හැකියාවක් පවතී.
- වහල් සේවයෙන් ඉවත්ව යාමට තැත් කළහොත් හෝ එසේ දමා ගියහොත් ඔවුන්ට මරණ දඬුවම හිමිවේ.
- වහල් ශ්‍රමිකයන්ගේ නිවෙස් සැම සති 2 කට වරක්ම පරික්ෂා කරනු ලැබේ. එයට හේතුව වනුයේ ආයුධ හෝ සොරකම් කරන ලද භාණ්ඩ තිබේදැයි පරික්ෂා කිරීමයි.
- කිසිම වහල් සේවකයෙකු ගෙවීමක් සඳහා ශ්‍රමය නොසපයයි.
- වහල් ශ්‍රමිකයන් දවසකට පැය 15 ක් ඉක්මා සහ ඉරිදා දිනයන්හි දී ද වැඩ කළ යුතුයි.

ඉහත කරුණු දෙස බලනකල හැසිරීම් සඳහා දඬුවම් පැමිණවීම යොදාගෙන ඇති බව පැහැදිලිය. එමගින් වහල් ශ්‍රමිකයන්ගේ හැසිරීම වහල් හිමියාට අවශ්‍ය පරිදි වෙනස් කර ඇත.

මෙතෙක් සාකච්ඡාවට බඳුන්කල සියලුම කරුණු දෙස බැලුකල වහල් සමාජය තුළ ශ්‍රමය සුරාකෑමක් පැවති බවට කිසිදු තර්කයක් නොමැත. නමුත් වහල් හිමියන්ගේ අරමුණු ළඟා කර ගැනිම සඳහා වහල් ශ්‍රමිකයන්ව උපයෝජනය කළ අයුරු ඉහත විස්තරකිරීම්වල සඳහන් වේ.

## 6. සාරාංශය

මානව සම්පත් උපයෝජනය සේවකයින්ගේ අයිතිවාසිකම් සුරකිමින් වර්තමානයේ සිදුකලද වහල් සමාජය තුළ මෙසේ ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා නොදෙමින් ශ්‍රමය සුරාකෑම මානුෂිකත්ව දෘෂ්ටි කෝණයෙන් බැලූ විට කොතරම් සාර්ථක ද අසාර්ථක ද යන්න ගැටළු සහගතය. වහල් සමාජය තුළ මානව සම්පත් උපයෝජනය සෘණාත්මක මුහුණුවරක් ගත් බවක් පෙනෙන අතර මානව සම්පත් උපයෝජනය කර ඇති බොහෝ ක්‍රමවේදයන් වහල් හිමියාගේ යහපතට මිස වහල් ශ්‍රමිකයන්ගේ යහපතට සිදු නොණුබව ඉහත කරුණුවලින් පැහැදිලි වේ. තවද වහල් ක්‍රමයේ විවිධ පැතිකඩ තවමත් වත්මන් සමාජය තුළ ගැබ්ව ඇති අතර එම ක්‍රමවේදයන් තුරන් කිරිමට අදාළ බලධාරින් ගෙන ඇති ක්‍රියා මාර්ගවල කාර්යක්‍ෂමතාව පිළිබඳව නැවත නැවතත් අවධානය යොමුකළ යුතු බව ඉහත කරුණු අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. History.com Staff 2009, Slavery in America,viewed 05 May 2015, <http://www.history.com/topics/black-history/slavery>
2. Microsoft Encarta 2000, Slavery in Africa, Online Encyclopedia, viewed 05 May 2015,
3. <http://autocww.colorado.edu/~flc/E64ContentFiles/AfricanHistory/SlaveryInAfrica.html>
4. Gascoigne, B 2001, History of Slavery, viewed 04 April 2015<http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
5. Hellie, R 2015, Slavery, viewed 13 May 2015,<http://global.britannica.com/EBchecked/topic/548305/slavery>
6. New Internationalist 2001, A Brief History of Slavery, viewed 05 May 2015 <http://newint.org/features/2001/08/05/history>
7. Gascoigne, Bamber 2001, History of Slavery, viewed 04 April 2015 <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
8. *Ibid*
9. Hellie, R 2015, Slavery, viewed 13 May 2015 <http://global.britannica.com/EBchecked/topic/548305/slavery>
10. History 2012, Slavery in Americaviewed 11 May 2015, <http://www.history.com/topics/black-

ISSN: 2012-7235

history/slavery>

11. Morgan, PD n.d, ‘The Origins of American Slavery, viewed 12 May 2015, <http://apcentral.collegeboard.com/apc/members/courses/teachers_corner/49355.html>
12. The Great Soviet Encyclopedia, 1979,3rd Edition, S.v. "Slaveholding System, viewed 10 May 2015,<http://encyclopedia2.thefreedictionary.com/Slaveholding+System>
13. Hellie, R 2015, Slavery, viewed 13 May 2015 <http://global.britannica.com/EBchecked/topic/548305/slavery>
14. Gascoigne, B 2001, History of Slavery, viewed 04 April 2015 <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
15. Wikipedia contributors n.d, Babylonian captivity', Wikipedia, The Free Encyclopedia, viewed 07 May 2015 <http://en.wikipedia.org/w/index.php?title=Babylonian_captivity&oldid=660823326>
16. The Great Soviet Encyclopedia 1979, 3rd Edition. S.V. Slaveholding System, viewed 10 May 2015, <http://encyclopedia2.thefreedictionary.com/Slaveholding+System>
17. Dale, T & Carter, VG 1995, Topsoil and civilization, First edition, Division of the University,the University of Oklahoma Press
18. Gascoigne, Bamber 2001, History of Slavery viewed 04 April 2015, <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
19. Hellie, R 2015, Slavery, viewed 13 May 2015, <http://global.britannica.com/EBchecked/topic/548305/slavery>
20. Gascoigne, Bamber 2001, History of Slavery viewed 04 April 2015, <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
21. Smith, C and College, D 2011, The Treatment of Athenian Slaves, viewed 07 May 2015, <https://cliojournal.wikispaces.com/The+Treatment+of+Athenian+Slaves>
22. Gascoigne, Bamber 2001, History of Slavery viewed 04 April 2015, <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
23. Cartwright, M 2013, Slavery in the Roman World, Ancient Hisory Encyclopedia viewed 07 May 2015, < http://www.ancient.eu /article/629/>
24. History Learning Site.co.uk. 2014, Roman Slaves, viewed 20 April 2015, <http://www.historylearningsite.co.uk/roman_slaves.htm>
25. New Internationalist 2001, A Brief History of Slavery, viewed 05 May 2015,<http://newint.org/features/2001/08/05/history/>
26. Wikipedia contributors 2015, Slavery in ancient Rome', Wikipedia, The Free Encyclopedia, viewed 10 May 2015, <http://en.wikipedia.org/w/index.php?title=Slavery_in_ancient_Rome&oldid=661059381>
27. Snell M 2011, Daily life and social history of middle ages, viewed 05 May 2015, <http://historymedren.about.com/od/dailylifesociety/a/Chains.htm>
28. Gascoigne, Bamber 2001, History of Slavery, viewed 04 April 2015 <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
29. Morgan, PD n.d, The Origins of American Slavery, viewed 12 May2015, <http://apcentral.collegeboard.com/apc/members/courses/teachers_corner/49355.html
30. Lambert T n.d, A ‘Brief history of slavery, viewed 04 April 2015 <http://www.localhistories.org/slavery.html>
31. Gascoigne, Bamber 2001, History of Slavery, viewed 04 April 2015, http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio
32. Morgan, PD n.d, The Origins of American Slavery, viewed 12 May 2015, <http://apcentral.collegeboard.com/apc/members/courses/teachers_corner/49355.html>
33. Gascoigne, Bamber 2001, History of Slavery, viewed 04 April 2015, <http://www.historyworld.net/wrldhis/PlainTextHistories.asp?ParagraphID=cio>
34. *Ibid*
35. Johnson, RK 1979, Some aspects of slavery in the muscle shoals areas, The Great Encyclopedia, viewed 13 May 2015,<http://encyclopedia2.thefreedictionary.com/Slaveholding+System>
36. Morgan, PD n.d, The Origins of American Slavery, viewed 12 May 2015, <http://apcentral.collegeboard.com/apc/members/courses/teachers_corner/49355.html>

ISSN: 2012-7235


37. Wikipedia contributors 2015, History of slavery, Wikipedia, The Free Encyclopedia, viewed 10 May 2015, <http://en.wikipedia.org/w/index.php?title=History_of_slavery&oldid=661464561>
38. History.com Staff 2009, Slavery in America, History.com, viewed 05 May 2015, <http://www.history.com/topics/black-history/slavery>
39. Stauffer, J 2013, Abolition and modern slavery , viewed 04 April 2015, <http://americanhistory.si.edu/blog/2013/02/abolition-and-modern-slavery-qa-with-professor-john-stauffer.html>
40. Anti-Slavery International n,d, Today's fight for tomorrow's freedom , viewed 03 April 2015, <http://www.antislavery.org/english/slavery_today/default.aspx>
41. Modern Abolition n.d, Learn about Five Forms of Slavery, viewed 13 May 2015, <http://freedomcenter.org/enabling-freedom/five-forms-of-slavery>
42. Weissbrodt, D 2002, Anti-Slavery International. Abolishing Slavery and its Contemporary Forms, New York and Geneva HR/PUB/02/4
43. Anti-Slavery International n.d, Today's fight for tomorrow's freedom, viewed 03 April 2015, <http://www.antislavery.org/english/slavery_today/default.aspx>
44. *Ibid*
45. Wikipedia contributors 2015, Treatment of slaves in the United States, Wikipedia, The Free Encyclopedia,viewed 01 May 2015, <http://en.wikipedia.org/w/index.php?title=Treatment_of_slaves_in_the_United_States&oldid=657925720>
46. Modern Abolition n.d, Learn about Five Forms of Slavery, viewed 13 May 2015, <http://freedomcenter.org/enabling-freedom/five-forms-of-slavery>
47. Anti-Slavery Internationaln.d, Today's fight for tomorrow's freedom, viewed 03 April 2015, <http://www.antislavery.org/english/slavery_today/default.aspx>
48. Modern Abolition n.d, Learn about Five Forms of Slavery, viewed 13 May 2015,<http://freedomcenter.org/enabling-freedom/five-forms-of-slavery>
49. Anti-Slavery Internationaln.d, Today's fight for tomorrow's freedom, viewed 03 April 2015, <http://www.antislavery.org/english/slavery_today/default.aspx>
50. Modern Abolition n.d, Learn about Five Forms of Slavery, viewed 13 May 2015<http://freedomcenter.org/enabling-freedom/five-forms-of-slavery>
51. Hellie, R 2015,Slavery, viewed 13 May 2015,<http://global.britannica.com/EBchecked/topic/548305/slavery>
52. New Internationalist 2001, A Brief History of Slavery, viewed 05 May 2015,<http://newint.org/features/2001/08/05/history/>
53. Wikipedia contributors n.d, Babylonian captivity, Wikipedia, The Free Encyclopedia, viewed 07 May 2015, <http://en.wikipedia.org/w/index.php?title=Babylonian_captivity&oldid=660823326>
54. History.com Staff 2009, Slavery in Americ,, History.com,viewed 05 Ma 2015,<http://www.history.com/topics/black-history/slavery>
55. Wikipedia contributors n.d, Babylonian captivity', Wikipedia, The Free Encyclopedia,viewed 07 May 2015,<http://en.wikipedia.org/w/index.php?title=Babylonian_captivity&oldid=660823326>
56. Anti-Slavery Internationaln.d, Today's fight for tomorrow's freedom, viewed 03 April 2015, <http://www.antislavery.org/english/slavery_today/default.aspx>
57. History.com Staff 2009, Slavery in Americ, History.com,viewed 05 May 2015,<http://www.history.com/topics/black-history/slavery>
58. History 2012, Slavery in America,viewed 11 May 2015,<http://www.history.com/topics/black-history/slavery>
59. Modern Abolition n.d,Learn about Five Forms of Slavery, viewed 13 May 2015,<http://freedomcenter.org/enabling-freedom/five-forms-of-slavery>
60. Kottawatta, KHH 2008, Developing closed system of HRM against the open system of HRM, Author, Colombo.
61. History2012, Slavery in America, viewed 11 May 2015,<http://www.history.com/topics/black-history/slavery>

ISSN: 2012-7235

62. Opatha, HHDNP 2012, Human Resource Management, Opatha, Sri Lanka, p-07
63. Rodriguez, J 2007, Slavery in the United States: A Social, Political, and Historical Encyclopedia, <http://www.abcclio.com/ABCCLIOCorporate/product.aspx?pc=A1567C>
64. History.com Staff 2009, Slavery in America, History.com viewed 05 May 2015, http://www.history.com/topics/black-history/slavery
65. History2012, Slavery in America, viewed 11 May 2015, <http://www.history.com/topics/black-history/slavery>
66. History.com Staff 2009, Slavery in America, History.com, viewed 05 May 2015,http://www.history.com/topics/black-history/slavery
67. History2012, Slavery in America, viewed 11 May 2015, <http://www.history.com/topics/black-history/slavery>
68. Burke, Mutti, D 2010, On Slavery's Border: Missouri's Small Slaveholding Households, 1815-1865, University of Georgia Press
69. Covey, Herbert, C 2008, African American Slave Medicine: Herbal and Non-Herbal Treatments, Lexington Books
70. Burke, Mutti, D 2010, On Slavery's Border: Missouri's Small Slaveholding Households, 1815-1865, University of Georgia Press
71. Christian, Charles, M, Bennet and Sari 1998, Black Saga: The African American Experience : A Chronology, Basic Civitas Books, pp-144
72. *Ibid*
73. Wikipedia contributors 2014, Punishment psychology, Wikipedia, The Free Encyclopedia,viewed 30 April 2015, <http://en.wikipedia.org/w/index.php?title=Punishment_(psychology)&oldid=637679131>
74. Sociology guide, 2015 The Slavery Systemviewed 12 May 2015,<http://www.sociologyguide.com/social-stratification/slavery-system.php>
75. Christian, Charles, M, Bennet and Sari 1998, Black Saga: The African American Experience : A Chronology, Basic Civitas Books, pp 27-28
76. Ushistory.org. 2015, *Slave Codes*viewed 10 April 2015, <http://www.ushistory.org/us/6f.asp>
77. Christian, Charles, M, Bennet and Sari 1998, *Black Saga: The African American Experience : A Chronology*, Basic Civitas Books, pp 27-28
78. Raymer, G 2014, *History 110*, viewed 04 April 2015,<http://users.humboldt.edu/ogayle/hist110/enslaved.html>



ආර්. ජී. එස්. ලක්ෂිකා,



වී. ආර්. රණසිංහ,



බී. ඩී. පී. රොද්‍රිගෝ,

ඒ. එච්. පී. චාමිකා



එල්. එල්. ඩී. එන්. මධුවන්ති,